# යා දෙක නොරත රත

ඉලෙක්ට්‍රෝන කාක්ෂිකයකින් වෙනත් කාක්ෂිකයකට පැනීම සහ චුති චිත්තය නැති වී පටිසන්ධි චිත්තය ඇතිවීම සන්සන්දනය කර සාදෘශ්‍යයක් ගැන කතාකිරීමෙන්, සාදෘශ්‍යය නිවැරදි වුවත් පුනබ්භවය තේරුම්ගත හැකි නොවෙයි. කලින් සඳහන් කෙරී ඇති ආකාරයට, චුති චිත්තය නැති වී පටිසන්ධි චිත්තය ඇතිවීම ඉලෙක්ට්‍රෝන කාක්ෂික මාරුකිරීම සමග සන්සන්දනය කළ හැකි නම් වෙනත් චිත්තයක් නැති වී තවත් චිත්තයක් ඇතිවීම ද ඉලෙක්ට්‍රෝනයක් කාක්ෂිකයකින් තවත් කාක්ෂිකයකට මාරුවීම ද ඒ අයුරින් ම සන්සන්දනය කළ හැකි ය. යමකු එසේ නොකරන්නේ නම් එයට හේතුව සාමාන්‍ය අවස්ථාවක චිත්තයක් වෙනුවට තවත් චිත්තයක් ඇති වීම එක ම තැනක සිදුවන බවත් චුති චිත්තය නැති වී පටිසන්ධි චිත්තය ඇතිවන්නේ අවකාශයේ වෙනත් තැනක බවත් උපකල්පනය කිරීම ය. චිත්තයක් යන්න එක ලක්‍ෂ්‍යයක ඇතිවන දෙයක් නොව මුළු ශරීරය පුරාමත් ඇතිවන අරූපාවචරවූවක් බව කලින් සඳහන් කෙරී ඇත.

එයටත් වඩා මේ පුනබ්භවය සඳහා සාදෘශ්‍ය පෙන්වන්නන් අමතක කරන තවත් වැදගත් කරුණක් වෙයි. ඒ සාමාන්‍ය අවස්ථාවල පවා චිත්තයක් නැති වී වෙනත් චිත්තයක් එකම තැනක නූපදින බව ය. ඔවුන්ගේ උපකල්පනය අනුව චුති චිත්තය නැති වන්නේ එක් තැනක ය. පටිසන්ධි චිත්තය ඇතිවන්නේ වෙනත් දුරින් පිහිටි තැනක ය. එහෙත් සාමාන්‍යයෙන් චිත්තයක් නැති වී වෙනත් චිත්තයක් ඇතිවන්නේ එකම තැනක ය. එහෙත් සාදෘශ්‍යකරුවන්ගේ අවාසනාවට එය එසේ නොවේ. එසේ වීමට නම් චිත්ත ඇතිවන්නේ යැයි කියන ශරීර කූඩුව අවකාශයේ එකම ලක්‍ෂ්‍යයක පිහිටිය යුතු ය. ශරීර කූඩුව එසේ නිශ්චලව අවකාශයේ එකම තැනක පිහිටි දෙයක් නොවේ. ශරීර කූඩුව පෘථිවිය මත ඇති බැවින් ම එය පෘථිවියත් සමග චලිතයෙහි යෙදෙයි. පෘථිවිය තම අක්‍ෂය වටා පරිභ්‍රමණය වෙමින් සූර්යයා වටා යයි. එයට අමතර ව සූර්යයා ද චලනය වෙයි. සූර්යයා ද පිහිටා ඇති අපේ මන්දාකිණිය ද නිශ්චලව පවත්නා වස්තුවක් නොවෙයි. මේ සියල්ල මදිවාට මෙන් විශ්වය ද ප්‍රසාරණය වෙයි.

මෙයින් පැහැදිලි වන්නේ ශරීර කූඩුව එක් තැනක නිශ්චල ව නොපවතින බව ය. එය ද, සංකීර්ණ චලිතයක යෙදෙයි. එසේ නම් ශරීර කූඩුව තුළ චිත්තයක් නැති වී වෙනත් චිත්තයක් ඇතිවන්නේ එකම තැනක නොවේ. චිත්තයක් නැති වී වෙනත් චිත්තයක් ඇති වන විට ශරීරය ද සුළු වශයෙන් හෝ දුරක් ගමන්කරයි. එසේ නම් අළුත් චිත්තය ඇතිවන්නේ පැරණි චිත්තය ඇති වූ තැන ම නොවෙයි. එහෙත් මෙහි දී යමකු පවසනු ඇත්තේ එලෙස ශරීර කූඩුව ගමන්කරන්නේ ඉතා කුඩා දුරක් බව ය. එපමණක් නොව ඒ කෙටිදුර ශරීර කූඩුව ගමන්කරන්නේ සන්තතික ව බව ද අප ප්‍රශ්න විචාරකයා අපට මතක්කර දෙනු ඇත.

මෙය හුදු උපකල්පනයක් පමණකි. ඒ උපකල්පනය කරන්නෝ පෘථිවියට ඇත්තේ සන්තතික චලිතයක් පමණක් යැයි සිතති. ශරීර කූඩුව සමග සිදුවන පොළොවේ චලිතය සන්තතික නොවිය හැකි දැයි ඔවුන්ගෙන් ප්‍රශ්න කළහොත් ඔවුන් කුමක් කියාවි ද? අනෙක් අතට ශරීර කූඩුව සන්තතික චලනයක යෙදුණ ද, චිත්තයක් නැති වී තවත් චිත්තයක් ඇතිවීම සන්තතික ව සිදුවන බවක් ඔවුන් දන්නේ කෙසේ ද?

එයට අමතරව මේ ඊනියා සාදෘශ්‍යයෙන් පැන නගින තවත් වැදගත් ප්‍රශ්න ගණනාවක් ම තිබෙයි. ඉලෙක්ට්‍රෝන කාක්ෂිකයකින් තවත් කාක්ෂිකයකට පනින්නේ යැයි කීමේ දී උපකල්පනය කෙරෙන්නක් නම් එකම ඉලෙක්ට්‍රෝනය කෙසේ හෝ වෙනත් කාක්ෂිකයකට පනින බව ය. එක් කාක්‍ෂකයකින් චුත වන ඉලෙක්ට්‍රෝනය ම වෙනත් කාක්ෂිකයකට පනින්නේ යැයි කියනු ලැබෙයි. එහෙත් චිත්ත ගැන කිව හැක්කේ කුමක් ද? පුනබ්භවය සිදුවන අවස්ථාවේ දී නොව සාමාන්‍ය අවස්ථාවක දී පවා චිත්තයක් නැති වී වෙනත් චිත්තයක් ඇතිවෙයි. එකම චිත්තය වෙනත් ආකාරයකින් ඇතිවන්නේ යැයි නොකියැවෙයි. සිංහල ථෙරවාද බෞද්ධයනට අනුව චිත්තයක් ඉපදී ඉතා සුළු කාලයක් පැවතී නැති වී යයි. ඒ පවත්නා සුළු කාලය තුළ දී පවා චිත්තය වෙනස් වෙයි. වෙනස් නොවී සුළු කාලයක් හෝ පවතින්නක් නැත. කාලය යන සංකල්පය ම අවශ්‍ය වී ඇත්තේ සියල්ල වෙනස්වන බැවිනි. කිසිවක් වෙනස් නොවන ලෝකයක කාලය යනුවෙන් සංකල්පයක් අවශ්‍ය නොවෙයි.

© Prof. Nalin De Silva

ඉපිද සුළු කාලයක් (වෙනස් වෙමින්) පවතින චිත්තය නැතිවෙයි (භංග වෙයි). ඒ චිත්තය නැතිවනවාත් සමග ම වෙනත් චිත්තයක් ඇතිවෙයි. එසේ අළුතින් ඇතිවන්නේ වෙනත් ම චිත්තයක් මිස කලින් තිබූ චිත්තය නොවෙයි. පටිසන්ධි චිත්තය චුති චිත්තයෙන් වෙනස්වනු පමණක් නොව වෙනත් චිත්තයක් ද එයට කලින් තිබූ චිත්තයෙන් මෙන් ම පසුව ඇතිවන චිත්තයෙන් ද වෙනස් වෙයි. එවිට චිත්තයක් එක් තැනක සිට තවත් තැනකට යෑම යන ප්‍රශ්නය පැන නොනගියි. එයට හේතුව එසේ තවත් තැනකට සංතතික ව හෝ අසංතතික ව යන චිත්තයක් නොමැති බැවිනි. මෙය ඉතා වැදගත් කරුණක් වන බැවින් ඒ පිළිබඳ තවදුරටත් සාකච්ඡා කළ යුතු වෙයි.

අපි පළමුව බටහිර භෞතික විද්‍යාවෙහි කියැවෙන ඉලෙක්ට්‍රෝනයට නැවතත් යමු. බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාවට අනුව ඉලෙක්ට්‍රෝනයක් පරමාණුවක් තුළ යම් කාක්ෂිකයක වෙයි. මේ ඉලෙක්ට්‍රෝනය එක්කෝ බාහිරින් ලැබෙන විකිරණ මගින් ශක්තිය අවශෝෂණය කර එය පවතින කාක්ෂිකයට වඩා ඉහළ කාක්ෂිකයකට පනියි. නැත්නම් යම් ශක්තියක් විකිරණ මගින් මුදාහැර පවතින කාක්ෂිකයට වඩා පහළ කාක්ෂිකයට පනියි. මෙහි දී වැදගත් වන්නේ එකම ඉලෙක්ට්‍රෝනයක් ඉහළ කාක්ෂිකයකට පනින බව ය. නැත්නම් එකම ඉලෙක්ට්‍රෝනයක් පහළ කාක්ෂිකයකට පනින බව ය.

ඉලෙක්ට්‍රෝනයක් යම් කාක්ෂිකයක ඇති විට අවශෝෂණය කරන ශක්තිය හෝ මුදා හැරෙන ශක්තිය හේතුකොටගෙන වෙනත් ඉලෙක්ට්‍රෝනයක් ඇති නොවන්නේ දැයි කෙනකුට ප්‍රශ්න කළ හැකි ය. එහෙත් බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාවට අනුව ඒ එසේ නොවෙයි. ශක්තිය අවශෝෂණය කිරීමෙන් හෝ ශක්තිය මුදා හැරීමෙන් හෝ පසුව පවතින්නේ ද කලින් තිබූ ඉලෙක්ට්‍රෝනය ම ය. එහි දී සිදුවන්නේ අළුත් ඉලෙක්ට්‍රෝනයක් ඇතිවීම නොව තිබූ ඉලෙක්ට්‍රෝනයේ ම ශක්තිය එක්කෝ වැඩිවීම ය. නැත්නම් ශක්තිය අඩුවීම ය. ඉලෙක්ට්‍රෝනයක ශක්තිය අඩුවීම හෝ වැඩිවීම හේතුවෙන් අළුත් ඉලෙක්ට්‍රෝනයක් ඇතිවන්නේ යැයි බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාව නොකියයි.

බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි කියැවෙන්න (උපකල්පනය කෙරෙන්න) කෙසේ වෙතත් ශක්තිය වැඩිවීම හෝ අඩුවීම හෝ නිසා අළුත් ඉලෙක්ට්‍රෝනයක් ඇතිවිණි යැයි සිතමු. දැන් ප්‍රශ්නය වනුයේ එසේ අළුත් ඉලෙක්ට්‍රෝනයක් ඇතිවන්නේ කොතැනක ද යන්න ය. අළුත් ඉලෙක්ට්‍රෝනය මුල් කාක්ෂිකයෙහි ම ඇති වී එසේ ඇතිවූ ඉලෙක්ට්‍රෝනය ඉහළ හෝ පහළ කාක්ෂිකයකට පනින්නේ ද, එසේත් නැත්නම් පැරණි ඉලෙක්ට්‍රෝනය ශක්තිය අවශෝෂණය කිරීම හෝ මුදාහැරීම සමග අනෙක් කාක්ෂිකයට පැනීමත් සමග අළුත් ඉලෙක්ට්‍රෝනයක් ඇති වන්නේ ද? වෙනත් වචනවලින් කියන්නේ නම් වැඩි වූ හෝ අඩු වූ හෝ ශක්තිය මුල් ඉලෙක්ට්‍රෝනයට ද ඇත් ද?

මේ ප්‍රශ්නය මේ ආකාරයෙන් බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි අසා ඇතැයි මම නොසිතමි. එයට හේතුව ආත්මවාදීන් වූ බටහිර භෞතික විද්‍යාඥයන්ට (සිංහල ථෙරවාදී බෞද්ධ යැයි කියන්නකු වුව ද සවිඥානික ව කටයුතු නොකරන්නේ නම් බටහිර භෞතික විද්‍යාඥයකු ලෙස ක්‍රියා කරන්නේ ආත්මවාදියකු ලෙස ය.) එවැනි ප්‍රශ්නයක් ඇසීමට තරම් සංස්කෘතික පසුබිමක් නො වීම ය. බටහිර භෞතික විද්‍යාඥයන්ට යමක් ද්‍රව්‍යමය වශයෙන් (substantially) පවතියි. එය ශක්තිය වැඩිකරගනු විය හැකි ය. එසේත් නැත්නම් අඩුකරගනු විය හැකි ය. එහෙත් ඒ නිසා එහි ද්‍රව්‍යමය තත්ත්වයෙහි වෙනසක් සිදු නොවෙයි. එබැවින් බටහිර භෞතික විද්‍යාවෙහි ඉලෙක්ට්‍රෝනය ශක්තිය අඩුවීමෙන් හෝ වැඩිවීමෙන් හෝ පසුව ද පැරණි ඉලෙක්ට්‍රෝනය ලෙස ම පවතියි.

බටහිර භෞතික විද්‍යාව කුමක් උපකල්පනය කළ ද අපට කලින් ඇසූ ප්‍රශ්නය ඇසීමට බාධාවක් නැත. ආත්මවාදී නොවන සිංහල ථෙරවාදී බෞද්ධයනට සදාකාලික ඉලෙක්ට්‍රෝන නැත. ඉලෙක්ට්‍රෝන ද ඇති වී නැතිවෙයි. අළුත් කාක්ෂිකයෙහි ඇත්තේ පැරණි කාක්ෂිකයෙහි තිබූ ඉලෙක්ට්‍රෝනය නොවෙයි. එහෙත් අපට ගැටළුව වන්නේ පැරණි ඉලෙක්ට්‍රෝනය එසේ නොවන්නේ කිනම් අවස්ථාවකින් පසුව ද යන්න ය. ඒ ශක්තිය අවශෝෂණය කිරීම හෝ මුදාහැරීම සමග ද? එසේත් නැත්නම් අළුත් කාක්ෂිකයට පැනීමෙන් පසුව ද? එසේත් නැත්නම් ඒ දෙකම එකවිට සිදු වන්නේ ද? එනම් ශක්තිය අවශෝෂණය කිරීම හෝ මුදාහැරීම හෝ සමග ම අළුත් කාක්ෂිකයකට පැනීමත් ඉලෙක්ට්‍රෝනය පැරණි ඉලෙක්ට්‍රෝනය නොවීමත් සිදු වන්නේ ද? වෙනත් වචනවලින් කියන්නේ නම් ශක්තිය අවශෝෂණය කිරීම හෝ මුදාහැරීම හෝ යන සිද්ධියත් අළුත් කාක්ෂිකයකට පැනීම යන සිද්ධියත් සමගාමී ව සිදුවන්නේ ද?

© Prof. Nalin De Silva

පුනබ්භවයට පරමාණුවල ඇති ඉලෙක්ට්‍රෝන ආධාරයෙන් සාදෘශ්‍ය ගොඩනගන්නෝ මෙවැනි ප්‍රශ්න නොනගති. ඔවුන් කර ඇත්තේ කිසිම වගවිභාගයකින් තොරව ඉලෙක්ට්‍රෝනයක් එක් කාක්ෂිකයක සිට තවත් කාක්ෂිකයකට පැනීම සමග චුති චිත්තය නැති වී පටිසන්ධි චිත්තය ඇතිවීම සමග සන්සන්දනය කිරීම ය. මෙහි දී ඔවුහු සාදෘශ්‍යය යන්න ගැන පවා තමන්ගේ නොදැනුම ප්‍රකාශ කරති. සාදෘශ්‍යයක සන්සන්දනය කරන සංසිද්ධි අතර යම් සමරූපි බවක් තිබිය යුතු ය. එහෙත් මේ ඊනියා සාදෘශ්‍යයෙහි එවැනි සමරූපී බවක් හෝ නැත. බටහිර ක්වොන්ටම් භෞතිකය ඉතා පැහැදිලිව ම ද්‍රව්‍යමය වශයෙන් වෙනස් නොවී කාක්ෂිකයකින් වෙනත් කාක්ෂිකයකට පනින ඉලෙක්ට්‍රෝන ගැන කතා කරයි. සිංහල ථෙරවාදී බුද්ධාගම නැතිවී ඇතිවන චිත්ත ගැන සඳහන් කරයි. එහි චුති චිත්තය නැති වී පටිසන්ධි චිත්තය ඇතිවෙයි. මේ සංසිද්ධි දෙක අතර ඇත්තේ මහත් වෙනසකි. ඒ සංසිද්ධි දෙක සන්සන්දනය කළ නොහැකි ය.

සිංහල ථෙරවාද බුද්ධාගම බටහිර විද්‍යාවෙන් තහවුරුකිරීමට යන්නන්ට මෙවැනි සියුම් වෙනස්කම් ගැන අවබෝධයක් නැත. ඔවුහු උඩින් පල්ලෙන් යමක් අතගා බලා යම් යම් දේ ගැන හුදු ජනප්‍රියභාවය සඳහා මත ප්‍රකාශ කරති. ඉහත සඳහන් සංසිද්ධි සම්බන්ධයෙන් ඔවුන් දුටුවේ මෙතැන සිටි සත්ත්වයා මිය පරලොව ගොස් අප දන්නා යුක්ලීඩීය හෝ රීමානියානු හෝ අවකාශ කාලයක ගමන් නොකර වෙනත් භවයක උපත ලැබීමත් ඉලෙක්ට්‍රෝනයක් ද අප දන්නා අවකාශ කාලයක ගමනක් නැතිව වෙනත් කාක්ෂිකයකට පැනීමත් ය. එය ඉතා මතුපිටින් දැකීමක් විය. ඉලෙක්ට්‍රෝනය බටහිර භෞතික විද්‍යාවෙහි ඉගැන්වෙන ආකාරයට ආත්මීය බව ද එමෙන් ම වෙනස් නොවන බව ද, එහෙත් සිංහල ථෙරවාද බුද්ධාගමෙහි සත්ත්වයා මතු නොව චිත්තය ද ආත්මීය නොවන බව ද, අනෙක් භවයක ඉපදෙන පටිසන්ධි චිත්තය මේ භවයෙහි චුත වූ චුති චිත්තය නොවන බව ද, ඔවුහු අමතක කළහ. එසේ අමතක කර යා දෙක නොරත රත පෑහීමට උත්සාහ කළහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva